## සේවායෝජකගේ වාර්ෂික ප්‍රකාශය සහ උපලේඛන සම්පූර්ණ කිරීමට උපදෙස්

## අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (අ. පු. ආ. බ - APIT)

## 2023/2024 තක්සේරු වර්ෂය

2023/2024 තක්සේරු වර්ෂය සඳහා සේවායෝජකගේ වාර්ෂික ප්‍රකාශය - අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT වාර්ෂික ප්‍රකාශය) හි **උපලේඛන 01, උපලේඛන 02 සහ උපලේඛන 03** ලෙස **උපලේඛන තුනක්** අන්තර්ගත කර ඇත. මෙම උපලේඛන සම්පූර්ණ කර APIT වාර්ෂික ප්‍රකාශය සමග **දේශීය ආදායම් වෙබ් ද්වාරය (www.ird.gov.lk) හරහා විද්‍යුත් මාර්ගයෙන් ඉදිරිපත් කිරීම කළ යුතුය.**

**"සේවායෝජකගේ වාර්ෂික ප්‍රකාශය - අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද" සහ උපලේඛන භාරදීම සඳහා වන මාර්ගෝපදේශ මාලාව**

### 1. APIT වාර්ෂික ප්‍රකාශය භාරදීම සඳහා වන පොදු උපදෙස්

පහත දෑ ඔබ විසින් සටහන් කර ගැනීම අවශ්‍ය වේ;

(අ) නව උපලේඛන පත්‍රිකා සහ යාවත්කාලීන කළ උපලේඛන සත්‍යාපන මෙවලම දේශීය ආදායම් වෙබ් ද්වාරයෙහි ඇත. (නිවැරදි උපලේඛන ආකෘතිය භාවිත කිරීමට වග බලා ගන්න. විශේෂිත ආකෘති වන්නේ **උපලේඛන 01, උපලේඛන 02 සහ උපලේඛන 03 ය.**)
සත්‍යාපන මෙවලම බාගත කර ගැනීමට: දේශීය ආදායම් වෙබ් ද්වාරය → බාගතකිරීම් →මෙවලම් → උපලේඛන ගොනුව සත්‍යාපන මෙවලම.

(ආ) **2024 අප්‍රේල් 01 වන දින සිට විද්‍යුත් ගොනු කිරීමේ සබැඳිය ලබාදෙනු ඇත.** අනවශ්‍ය තාක්ෂණික දෝෂ මගහරවා ගැනීම සඳහා නියමිත දිනයේ අවසාන මොහොත දක්වා බලා නොසිට වේලාසනින් භාරදීම සිදුකරන ලෙසට මෙයින් උපදෙස් දෙනු ලැබේ.

(ඇ) ඔබගේ ආයතනයේ සියළු සේවානියුක්තික වර්ගීකරණයන් සහ සියළුම අංශ සඳහා **එක් APIT වාර්ෂික ප්‍රකාශයක්** භාරදෙන ලෙසට තරයේ උපදෙස් දෙනු ලැබේ.

(ඈ) ඊ-සේවාව හරහා APIT වාර්ෂික ප්‍රකාශය ගොනු කිරීමේ දී, APIT වාර්ෂික ප්‍රකාශය සහ උපලේඛන ගොනු කිරීමට පෙර කරුණාකර මාසික බදු ගෙවීම් සත්‍යාපනය කරන්න.

(ඉ) 2023 අංක 04 දරන (සංශෝධන) දේශීය ආදායම් පනතින් සංශෝධනය කළ 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ (දේශීය ආදායම් පනතේ) 113(1ආ) වගන්තිය ප්‍රකාරව, 2023 අප්‍රේල් 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, APIT වාර්ෂික ප්‍රකාශයේ විද්‍යුත් ගොනු කිරීම (විද්‍යුත් ආකාරයට බදු වාර්තා ගොනු කිරීම) සියලුම සේවායෝජකයන්ට අනිවාර්ය වේ.

එමනිසා, 2023/2024 තක්සේරු වර්ෂයේ සිට ඉන් ඉදිරියට මුද්‍රිත විශේෂිත ආකෘතීන් භාවිතා කරමින් තම APIT වාර්ෂික ප්‍රකාශ ලිඛිතව භාරදීමට **කිසිදු සේවායෝජකයකුට හිමිකමක් නොමැත.**

(ඊ) පහත දෑ සම්බන්ධයෙන් දුෂ්කරතාවයන් ඇති වුවහොත්;

- **පද්ධතිය බිඳවැටීම**:
  1944 අංකය මඟින් දේශීය ආදායම් දෙපාර්තමේන්තු ඇමතුම් මැදිරිය හා සම්බන්ධ වී සහාය ලබාගන්න. නැතහොත් හඬ පටිගත කිරීමක් තබා ටිකට් අංකයක් ලබාගන්න.

- **උඩුගත කිරීමේ දුෂ්කරතා සහ උපලේඛන සත්‍යාපනය කිරීම හා සම්බන්ධ ගැටළු:**
  011-2134125, 011-2134133 හෝ 011-2134134 අංක මඟින් මධ්‍යම ලේඛන කළමනාකරණ අංශය අමතන්න.

### 2. විද්‍යුත් ගොනු කිරීමේ ක්‍රමය

**පහත සඳහන් දෑ සැළකිල්ලට ගෙන අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සඳහා උපලේඛන භාරදෙන්න**;

(අ) ඔබගේ **උපලේඛන ඒවායේ මෘදු පිටපත් භාවිත කරමින් ඊ-සේවාව හරහා භාරදීම** අනිවාර්යය වේ (කරුණාකර උපදෙස්මාලාව පරිශීලනය කරන්න).

(ආ) උඩුගත කිරීමේ ක්‍රියාවලිය ඔබට නුපුරුදු නම්, අදාළ උපලේඛනවල මෘදු පිටපතක්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ "**නැණසල**"**හෝ ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයකට** රැගෙනවිත් එහි රාජකාරියේ නියුතු දේශීය ආදායම් නිලධාරීන්ගේ සහාය ලබාගන්න.

උපලේඛන 01, 02 සහ 03 හි මෘදුපිටපත් බාගත කර ගැනීමට;

දේශීය ආදායම් වෙබ් ද්වාරය → බාගතකිරීම → උපලේඛන → වෙනත් බදු → උපයන විට ගෙවීම් (PAYE) / අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT)

## සේවායෝජකගේ වාර්ෂික ප්‍රකාශය සම්පූර්ණ කිරීම සඳහා වන උපදෙස් මාලාව - අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද සහ උපලේඛන

❖ **APIT වාර්ෂික ප්‍රකාශය - 2023/2024 තක්සේරු වර්ෂය (ත.ව.)**

**1. I කොටස**

**සේවානියුක්තිකයින් සංඛ්‍යාව**

- අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ක්‍රමය යටතේ බදු අඩුකර නොමැති සේවානියුක්තිකයින් සංඛ්‍යාව "A" කොටුවේ සඳහන් කරන්න;

  ➢ ප්‍රාථමික සේවා නියුක්තියෙහි හා ද්විතීයික සේවානියුක්තියෙහි නිරත වේ යැයි සැළකෙන 2023/2024 තක්සේරු වර්ෂය තුළ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු පටිපාටිය යටතේ බදු අඩු නොකළ සේවා නියුක්තිකයන් "A" කොටුවේ (සේවා නියුක්තිකයන් - බදු අඩු නොකළ) ඇතුළත් කළ යුතුය. **(උපලේඛනය 03 හා සම්බන්ධ තොරතුරු).**

- 2023/2024 තක්සේරු වර්ෂය තුළ ප්‍රාථමික සේවානියුක්තිය යටතේ බදු අඩුකර ඇති සහ එක් එක් දළ පාරිශ්‍රමික පරාසයන් යටතට ගැනෙන සේවානියුක්තිකයින් සංඛ්‍යාව **"i" කොටුවේ සිට "vii"**කොටුව දක්වා ඇතුළත් කරන්න. **(උපලේඛනය 01 හා සම්බන්ධ තොරතුරු).**

- ද්විතියික සේවානියුක්තියක නියුතු යැයි සැලකෙන සේවානියුක්තිකයින් සංඛ්‍යාව **"C" කොටුවේ** ඇතුළත් කරන්න**. (උපලේඛනය 01 හා සම්බන්ධ තොරතුරු).**

- 2023/2024 තක්සේරු වර්ෂය තුළ ප්‍රාථමික සහ ද්විතියික සේවානියුක්තියෙන් යන දෙකෙන්ම සිය සේවානියුක්තිය අවසන් කර ඇති සේවානියුක්තිකයින් සංඛ්‍යාව **"E" කොටුවේ** ඇතුළත් කරන්න. **(උපලේඛනය 02 හා සම්බන්ධ තොරතුරු).**

**සමස්ත දළ පාරිශ්‍රමිකය රුපියල්**

**එක් එක් සේවානියුක්තික ප්‍රභේදය** මඟින් උපයාගත් සමස්ත දළ පාරිශ්‍රමිකය ඇතුළත් කරන්න.

**බදු අඩුකිරීම් රුපියල්**

එක් එක් සේවානියුක්තික ප්‍රභේදය යටතේ සිදුකර ඇති අත්තිකාරම් පුද්ගල ආදායම් බදු අඩුකිරීම් ඇතුළත් කරන්න.

**2. II කොටස**

**(අ) නිදහස් කළ/බැහැර කරන ලද පාරිශ්‍රමිකය රුපියල්**

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත ප්‍රකාරව , 2023/2024 තක්සේරු වර්ෂයේ එක් එක් මාසය තුළදී අත්තිකාරම් පුද්ගල ආදායම් බදු යටතේ බදු අඩු කරන ලද සේවානියුක්තිකයින්ට ගෙවූ සමුච්චිත නිදහස් කළ/බැහැර කරන ලද පාරිශ්‍රමිකය "**A**" තීරුවේ ඇතුළත් කරන්න. **(උපලේඛනය 01 හා සම්බන්ධ තොරතුරු).**

**(ආ) අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දට යටත් සමස්ත දළ පාරිශ්‍රමිකය හා අඩු කරන ලද බද්ද රුපියල්**

අත්තිකාරම් පුද්ගල ආදායම් බදු යටතේ බදු අඩු කරන ලද සේවානියුක්තිකයින්ට **ගෙවූ සමුච්චිත පාරිශ්‍රමිකය "B"** තීරුවේ ඇතුළත් කරන්න. එක් එක් මාසයේ එවැනි **බදු අඩු කිරීම්වල සමුච්චිත ප්‍රමාණය "C"** තීරුවේ ඇතුළත් කරන්න. **(උපලේඛනය 01 හා සම්බන්ධ තොරතුරු).**

**(ඇ) කරන ලද ගෙවීම් (දණ්ඩන සහ පොලී ගෙවීම් හැර) රුපියල්**

එක් එක් මාසයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කරන ලද බදු ප්‍රමාණය (දඩ මුදල් හා පොළී ගෙවීම් රහිතව) **"D"** තීරුවේ සටහන් කරන්න **විශේෂයෙන් සැළකිලිමත්වන්න**. කරුණාකර ශත ගණන පැහැදිලිව ඇතුළත් කරන්න.

**(ඈ) සමස්ත සේවාන්ත ප්‍රතිලාභ සහ අඩු කරන ලද බද්ද රුපියල්**

තක්සේරු වර්ෂය තුළ එක් එක් මාසයේ සේවානියුක්තිකයින්ට ගෙවන ලද සමස්ත සේවාන්ත ප්‍රතිලාභ"**E**"තීරුවේ ඇතුළත් කරන්න. එක් එක් මාසයේ සේවාන්ත ප්‍රතිලාභ මත සිදු කළ එවැනි බදු අඩු කිරීම්වල සමුච්චිතය **"F"** තීරුවේ ඇතුළත් කරන්න. **(උපලේඛනය 02 හා සම්බන්ධ තොරතුරු).**

**(ඉ) කරන ලද ගෙවීම් (දඩ මුදල් සහ පොලී ගෙවීම් හැර ) රුපියල්**

එක් එක් මාසයේ සේවාන්ත ප්‍රතිලාභ වලින් අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කරන ලද බදු ප්‍රමාණය **"G"** තීරුවේ ඇතුළත් කරන්න. කරුණාකර ශත ගණන පැහැදිලිව ඇතුළත් කරන්න.

**3. III කොටස: ප්‍රකාශය**

APIT වාර්ෂික ප්‍රකාශය හෝ APIT වාර්ෂික ප්‍රකාශයේ කොටසක් අනුමත ගණකාධිකාරවරයෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකු විසින් යම් ගෙවීමක් සඳහා සකස් කරන්නේද යන්න " ඔව් " හෝ "නැත " යන කොටු තුළ ලකුණු කරන්න.

**(අ) කොටස : අනුමත ගණකාධිකාරිවරයා/වෙනත් යම් තැනැත්තා පිළිබඳව විස්තර**

බදු ගෙවන්නාගේ පූර්ණකාලීන සේවානියුක්තිකයකු හැර අනුමත ගණකාධිකාරවරයකු හෝ වෙනත් යම් තැනැත්තකු විසින් යම් ගෙවීමක් සඳහා APIT වාර්ෂික ප්‍රකාශය හෝ APIT වාර්ෂික ප්‍රකාශයේ කොටසක් සකස් කළ අවස්ථාවකදී (අ) කොටස සම්පූර්ණ කර එවැනි තැනැත්තකු විසින් නිකුත් කළ සහතිකය/සහතික අමුණන්න.

**(ආ) කොටස : සේවායෝජකයාගේ ප්‍රකාශය**

දේශීය ආදායම් පනතේ 126(4) වගන්තිය ප්‍රකාරව, බදු ගෙවන්නා හෝ බදු ගෙවන්නාගේ බලයලත් නියෝජිතයකු විසින් APIT වාර්ෂික ප්‍රකාශයේ නිරවද්‍යභාවය සහ සම්පූර්ණභාවය පිළිබඳ සහතික කර අත්සන් තැබිය යුතුය. එසේ හෙයින්, කළමනාකාර අධ්‍යක්ෂ / දෙපාර්තමේන්තු ප්‍රධානී / සභාපති හෝ සක්‍රීය හවුල්කරු / මූල්‍ය අධ්‍යක්ෂ / අධ්‍යක්ෂ / ලේකම් / භාරකරු / ගණකාධිකාරී / පරිපාලන නිලධාරී / ප්‍රධාන නිලධාරී / නිසි බලයලත් නියෝජිත විසින් වාර්ෂික ප්‍රකාශයේ ඔහුගේ/ඇයගේ නම සහ තනතුර සඳහන් කරමින් අත්සන් (දිනය යොදා) කළ යුතුය.

❖ **අත්තිකාරම් පුද්ගල ආදායම් බදු උපලේඛන**

1. **උපලේඛන 01 - 2023.04.01 සිට 2024.03.31 දක්වා එක් වරක් පමණක් කරන ගෙවීම් (සේවාන්ත ප්‍රතිලාභ) හැර අනෙක් පාරිශ්‍රමික**

මෙය ප්‍රාථමික හෝ ද්විතියික සේවානියුක්තිය යටතේ තම දළ පාරිශ්‍රමිකයෙන් අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ක්‍රමවේදය යටතේ **බදු අඩු කළ** සේවා නියුක්තිකයින්ගේ තොරතුරු ඇතුළත් ලේඛනය වේ.

අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගෙවීම් පත්‍රයෙන් උපුටා ගන්නා ලද **නිර්වාසිකයන්** ඇතුළු එක් එක් සේවානියුක්තිකයා පිළිබඳ (එක් වරක් පමණක් කරන ගෙවීම් හැර) වන විස්තර සහ සංඛ්‍යාත්මක තොරතුරු **උපලේඛන 01** හි අදාළ කොටුවල ඇතුළත් කරන්න.

2. **උපලේඛන 02 - 2023.04.01 සිට 2024.03.31 දක්වා එක් වරක් පමණක් කරන ගෙවීම් (සේවාන්ත ප්‍රතිලාභ)**

මෙය එක්වරක් පමණක් කරන ගෙවීම්වලට අදාළව සේවානියුක්තිකයින්ගේ තොරතුරු සඳහා වන ලේඛනයයි.

තක්සේරු වර්ෂය ඇතුළත තම සේවානියුක්තිය අවසන් කරන ලද හෝ නවතා දමන ලද සේවානියුක්තිකයින්ට අදාළ විස්තර සහ සංඛ්‍යාත්මක තොරතුරු ඇතුළත් කරන්න. කෙසේ නමුදු, සේවය අවසන් කරන ලද දින සිට දින 90 ක් ඇතුළත එක් වරක් පමණක් කරනු ලබන ගෙවීම් මත වන බදු බැදියාව නිවැරදිව නිර්ණය කර නොමැති සේවානියුක්තිකයින්ගේ විස්තර ඇතුළත් නොකරන්න.

එක් වරක් පමණක් කරන ලද ගෙවීම් (සේවාන්ත ප්‍රතිලාභ) හා සම්බන්ධ තොරතුරු පමණක් **උපලේඛන 02 හි** ඇතුළත් කළ යුතු බව කාරුණිකව සළකන්න.

3. **උපලේඛනය 03 - 2023.04.01 සිට 2024.03.31 දක්වා බදු අයවන සීමාවට වඩා අඩු වීම (මාසික දළ පාරිශ්‍රමිකය රු. 100,000 ට වඩා අඩු වීම හෝ වාර්ෂික දළ පාර්ශ්‍රමික රු 1,200,000ට වඩා අඩුවීම) හේතුවෙන් අත්තිකාරම් පුද්ගල ආදායම් බදු <u>අඩු නොකළ</u> සේවානියුක්තිකයන්ගේ ලැයිස්තුව**

   මෙය බදු අඩු නොකළ සේවානියුක්තිකයන්ගේ තොරතුරු සඳහා වන ලේඛනයයි.

   2023/2024 තක්සේරු වර්ෂයේ දී සීමාවට වඩා අඩු වීම හේතුවෙන් (මාසික දළ පාරිශ්‍රමිකය රු. 100,000 ට වඩා අඩු වීම හෝ වාර්ෂික දළ පාරිශ්‍රමිකය 1,200,000ට වඩා අඩු වීම) අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩු නොකළ සියළු සේවා නියුක්තිකයන්ගේ විස්තර හා සංඛ්‍යාත්මක තොරතුරු මෙම උපලේඛනයේ ඇතුළත් කරන්න. (කරුණාකර APIT බදු වාර්ෂික ප්‍රකාශයේ I කොටසේ "A" කොටුව බලන්න.)

   තවද, යම් සේවානියුක්තිකයකු දැනටමත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී බදු ගෙවන්නා හැඳින්වීමේ අංකය (TIN) ලබා ගෙන ඇත්නම්, එම TIN අංකය **උපලේඛන 03 හි** "N" තීරුවේ ඇතුළත් කිරීමට කටයුතු කරන්න.

❖ **පහත වගුවේ සඳහන් කර ඇති I කොටස, II කොටස, උපලේඛන 01, උපලේඛන 02 හා උපලේඛන 03 හි සංඛ්‍යා, පහත සඳහන් වගුව පරිදි ගැළපීමට ඔබගේ අවධානය යොමු කරන්න**.

| | I කොටස | II කොටස | උපලේඛන 01 | උපලේඛන 02 | උපලේඛන 03 |
|---|---|---|---|---|---|
| සමස්ත දළ පාරිශ්‍රමිකය | 'A' කොටුව | | | | 'H' කොටුව - ප්‍රාථමික සහ ද්විතියික සේවා නියුක්තිය යටතේ සමස්ත දළ පාරිශ්‍රමිකය |
| සමස්ත දළ පාරිශ්‍රමිකය | 'B' කොටුව + 'C' කොටුව | 'B' තීරුවේ එකතුව | | | |
| බදු අඩු කිරීම් | 'B' කොටුව + 'C' කොටුව | 'C' තීරුවේ එකතුව | | | |
| සමස්ත දළ පාරිශ්‍රමිකය | 'E' කොටුව | 'E' තීරුවේ එකතුව | | | |
| බදු අඩු කිරීම් | 'E' කොටුව | 'F' තීරුවේ එකතුව | | | |
| සමස්ත දළ පාරිශ්‍රමිකය | 'B' කොටුව + 'C' කොටුව | | 'H' තීරුවේ එකතුව | | |
| බදු අඩු කිරීම් | 'B' කොටුව | | 'J' තීරුවේ එකතුව | | |
| බදු අඩු කිරීම් | 'C' කොටුව | | 'K' තීරුවේ එකතුව | | |
| සමස්ත දළ පාරිශ්‍රමිකය | 'E' කොටුව | | | 'I' තීරුවේ එකතුව | |
| බදු අඩු කිරීම් | 'E' කොටුව | | | 'M' තීරුවේ එකතුව | |
| සේවානියුක්තිකයින් සංඛ්‍යාව | 'A' කොටුව | | | | ප්‍රාථමික හා ද්විතීයික සේවා නියුක්තිය යටතේ මුළු සේවානියුක්තිකයින් සංඛ්‍යාව |
| සේවානියුක්තිකයින් සංඛ්‍යාව | 'B' කොටුව + 'C' කොටුව | | මුළු සේවානියුක්තිකයින් සංඛ්‍යාව | | |
| සේවානියුක්තිකයින් සංඛ්‍යාව | 'E' කොටුව | | | මුළු සේවානියුක්තිකයින් සංඛ්‍යාව | |
| නිදහස්/ බැහැර කරන ලද පාරිශ්‍රමිකය | | 'A' තීරුවේ එකතුව | 'I' තීරුවේ එකතුව | | |